මූලික වාර්තාව

# ශ්‍රී ලංකාවේ සංහිඳියාව පිළිබඳ මහජන මතය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
සෝෂල් ඉන්ඩිකේටර්

ජුලි 2024

# පටුන


හැඳින්වීම ......... 1
ක්‍රමවේදය ......... 1
විධායක සාරාංශය ......... 2
සොයාගැනීම් ......... 8

ආර්ථික කටයුතු සඳහා ඇති අවස්ථාවන් ......... 8

**ප්‍රස්තාරය 01:** වසර 15කට පෙර හා සසඳන විට, ඔබ ජීවත් වන ප්‍රදේශයේ තිබෙන ආර්ථික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද? - ජාතික සහ ජනවාර්ගික ......... 8
**ප්‍රස්තාරය 02:** වසර 15කට පෙර හා සසඳන විට, ඔබ ජීවත් වන ප්‍රදේශයේ තිබෙන ආර්ථික අවස්ථා ඔබ තක්සේරු කරන්නේ කෙසේද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ......... 8
**ප්‍රස්තාරය 03:** ඔබේ ජනවාර්ගික ප්‍රජාව, අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබගේ ජනවාර්ගික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - ජාතික ......... 8
**ප්‍රස්තාරය 04:** ඔබේ ජනවාර්ගික ප්‍රජාව, අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබගේ ජනවාර්ගික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - ජනවාර්ගික ......... 9
**ප්‍රස්තාරය 05:** ඔබේ ජනවාර්ගික ප්‍රජාව, අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබගේ ජනවාර්ගික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ......... 10
**ප්‍රස්තාරය 06:** ඔබේ ආගමික ප්‍රජාවට, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබේ ආගමික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - ජාතික ......... 10
**වගුව 01:** ඔබේ ආගමික ප්‍රජාවට, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික ......... 11
අවස්ථා සඳහා ප්‍රවේශය ඔබේ ආගමික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - ආගමික ......... 11
**ප්‍රස්තාරය 07:** ඔබේ ආගමික ප්‍රජාවට, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින ආර්ථික අවස්ථා සඳහා ප්‍රවේශය ඔබේ ආගමික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ......... 11

අධ්‍යාපනය සඳහා ඇති අවස්ථාවන් ......... 12

**ප්‍රස්තාරය 08:** වසර 15කට පෙර හා සසඳන විට, ඔබ ජීවත් වන ප්‍රදේශයේ පුද්ගලයන්ට තිබෙන අධ්‍යාපනික අවස්ථාවන් ඔබ තක්සේරු කරන්නේ කෙසේද? - ජාතික සහ ජනවාර්ගික ......... 12
**ප්‍රස්තාරය 09:** වසර 15කට පෙර හා සසඳන විට, ඔබ ජීවත් වන ප්‍රදේශයේ පුද්ගලයන්ට තිබෙන අධ්‍යාපනික අවස්ථාවන් ඔබ තක්සේරු කරන්නේ කෙසේද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ......... 12
**ප්‍රස්තාරය 10:** ඔබේ ජනවාර්ගික ප්‍රජාව, අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථාවන් සඳහා ප්‍රවේශය ඔබේ ජනවාර්ගික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - ජාතික ......... 13
**ප්‍රස්තාරය 11:** ඔබේ ජනවාර්ගික ප්‍රජාව, අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථාවන් සඳහා ප්‍රවේශය ඔබේ ජනවාර්ගික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - ජනවාර්ගික ......... 13
**ප්‍රස්තාරය 12:** ඔබේ ජනවාර්ගික ප්‍රජාව, අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථාවන් සඳහා ප්‍රවේශය ඔබේ ජනවාර්ගික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ 14
**ප්‍රස්තාරය 13:** ඔබේ ආගමික ප්‍රජාව, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථාවන් සඳහා ප්‍රවේශය ඔබේ ආගමික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - ජාතික ......... 14
**වගුව 02:** ඔබේ ආගමික ප්‍රජාව, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථාවන් සඳහා ප්‍රවේශය ඔබේ ආගමික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - ආගමික ......... 15
**ප්‍රස්තාරය 14:** ඔබේ ආගමික ප්‍රජාව, අනෙකුත් ආගමික ප්‍රජාවන් හා සසඳන විට, ඔබේ ප්‍රදේශයේ පවතින අධ්‍යාපනික අවස්ථාවන් සඳහා ප්‍රවේශය ඔබේ ආගමික ප්‍රජාවට වැඩි වී ඇති ද නැතිනම් අඩු වී ඇති ද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ......... 15

ආරක්ෂිත බව/ අනාරක්ෂිත බව පිළිබඳ හැඟීම ......... 16

**ප්‍රස්තාරය 15:** එදිනෙදා කටයුතුවලට, ආගමික කටයුතුවලට සහ ආර්ථික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජාතික ......... 16
**ප්‍රස්තාරය 16:** එදිනෙදා කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජනවාර්ගික ......... 16
**ප්‍රස්තාරය 17:** එදිනෙදා කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ......... 17
**වගුව 03:** ආගමික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ආගමික ......... 17

**ප්‍රස්තාරය 18:** ආගමික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ....................... 18

**ප්‍රස්තාරය 19:** ආර්ථික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - ජනවාර්ගික ................................................... 18

**ප්‍රස්තාරය 20:** ආර්ථික කටයුතුවලට සහභාගී වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනීම - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ....................... 19

**ප්‍රස්තාරය 21:** වසර 15කට පෙර හා සසඳන විට වර්තමානයේ සමස්ත ආරක්ෂාව පිළිබඳ ඇගයීම - ජාතික, ජනවාර්ගික ..................... 19

**ප්‍රස්තාරය 22:** වසර 15කට පෙර හා සසඳන විට වර්තමානයේ සමස්ත ආරක්ෂාව පිළිබඳ ඇගයීම - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ . 20

සමාජීය විශ්වාසය ........................................................................................................................................ 20

**ප්‍රස්තාරය 23:** උපකාර ලබා ගැනීම පිළිබඳ විශ්වාස මට්ටම - ජාතික ........................................................................ 20

**ප්‍රස්තාරය 24:** උපකාර ලබා ගැනීම පිළිබඳ විශ්වාස මට්ටම - ජනවාර්ගික ................................................................... 21

**ප්‍රස්තාරය 25:** උපකාර ලබා ගැනීම පිළිබඳ විශ්වාස මට්ටම - වයස ......................................................................... 21

**ප්‍රස්තාරය 26:** උපකාර ලබා ගැනීම පිළිබඳ විශ්වාස මට්ටම - ස්ත්‍රී පුරුෂභාවය ........................................................... 22

**ප්‍රස්තාරය 27:** උපකාර ලබා ගැනීම පිළිබඳ විශ්වාස මට්ටම - ප්‍රදේශ ....................................................................... 22

සමාජ අන්තර් සබඳතා ..................................................................................................................................... 23

**ප්‍රස්තාරය 28:** වෙනත් ජනවර්ගයකට අයත් කෙනෙකු සමඟ අන්තර් සබඳතා පවත්වන වාර ගණන - ජාතික සහ ජනවාර්ගික ............. 23

**ප්‍රස්තාරය 29:** වෙනත් ජනවර්ගයකට අයත් කෙනෙකු සමඟ අන්තර් සබඳතා පවත්වන වාර ගණන - වයස ................................ 23

**ප්‍රස්තාරය 30:** වෙනත් ජනවර්ගයකට අයත් කෙනෙකු සමඟ අන්තර් සබඳතා පවත්වන වාර ගණන - ප්‍රදේශ සහ ස්ත්‍රී පුරුෂභාවය ....... 24

**ප්‍රස්තාරය 31: මගේ ගමේ මිනිස්සු සමඟ** සම්බන්ධ වීමේදී **, රජයේ ආයතනයන්ගෙන්** සේවයක් ලබා ගැනීමට යාමේදී, **පොලිසිය සමඟ** ආයතනික මට්ටමේ කටයුත්තකට සම්බන්ධ වීමේදී ජනවාර්ගිකත්වය මත වෙනස්කොට සැලකීම පිළිබඳ මහජන මතය - ජාතික ................................................................................................. 24

**ප්‍රස්තාරය 32:** මගේ ගමේ මිනිස්සු මගේ ජනවාර්ගිකත්වය නොසළකා බොහෝ විට මට හොඳ විදියට සලකනවා - ජනවාර්ගික ............ 25

**ප්‍රස්තාරය 33:** මගේ ගමේ මිනිස්සු මගේ ජනවාර්ගිකත්වය නොසළකා බොහෝ විට මට හොඳ විදියට සලකනවා - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ................................................................................................. 25

**ප්‍රස්තාරය 34:** මම රජයේ ආයතනයන්ගෙන් සේවයක් ලබා ගැනීමට යාමේදී, මගේ ජනවාර්ගිකත්වය නොසලකා ඔවුන් බොහෝ විට මට හොඳ විදියට සලකනවා - ජනවාර්ගික ................................................................................. 26

**ප්‍රස්තාරය 35:** මම රජයේ ආයතනයන්ගෙන් සේවයක් ලබා ගැනීමට යාමේදී, මගේ ජනවාර්ගිකත්වය නොසලකා ඔවුන් බොහෝ විට මට හොඳ විදියට සලකනවා - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ..................................................... 26

**ප්‍රස්තාරය 36:** පොලිසිය සමඟ ආයතනික මට්ටමේ කටයුත්තකට සම්බන්ධ වීමේදී, මගේ ජනවාර්ගිකත්වය නොසලකා ඔවුන් බොහෝ විට මට හොඳ විදියට සලකනවා - ජනවාර්ගික ................................................................................. 27

**ප්‍රස්තාරය 37:** පොලිසිය සමඟ ආයතනික මට්ටමේ කටයුත්තකට සම්බන්ධ වීමේදී, මගේ ජනවාර්ගිකත්වය නොසලකා ඔවුන් බොහෝ විට මට හොඳ විදියට සලකනවා - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ..................................................... 27

විවිධ ජනවාර්ගික කණ්ඩායම් කෙරෙහි දක්වන ආකල්පය ...................................................................................... 28

**ප්‍රස්තාරය 38:** විවිධ ජනවාර්ගික කණ්ඩායම් කෙරෙහි ඇති ආකල්පය - ජාතික ........................................................... 28

**ප්‍රස්තාරය 39:** ඔබ ජීවත්වන ප්‍රදේශයේ අසල්වැසියන්ගෙන්, අඩකට වඩා වෙනස් ජනවාර්ගික කණ්ඩායමක් සිටීම - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ................................................................................................. 28

**ප්‍රස්තාරය 40:** විවිධ ජනවාර්ගික ප්‍රජාවන්ට අයත් පුද්ගලයන් සමඟ වැඩ කිරීම - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ......................... 29

**ප්‍රස්තාරය 41:** පවුලේ සමීපතම සාමාජිකයෙකු වෙනත් ජනවර්ගයකට අයත් කෙනෙකු සමඟ විවාහ වීම - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ................................................................................................. 29

**ප්‍රස්තාරය 42:** විවිධ ආයතනවල ජනවාර්ගිකත්වය අනුව වෙනස් ලෙස සැලකීම - ජාතික ................................................... 30

**ප්‍රස්තාරය 43:** විවිධ ආයතනවල ජනවාර්ගිකත්වය පදනම් කරගෙන ලෙස සැලකීම - ජනවාර්ගික ............................................ 30

**ප්‍රස්තාරය 44:** විවිධ ආයතනවල ජනවාර්ගිකත්වය පදනම් කරගෙන වෙනස් ලෙස සැලකීම - ස්ත්‍රී පුරුෂභාවය ............................... 31

**ප්‍රස්තාරය 45:** විවිධ ආයතනවල ජනවාර්ගිකත්වය පදනම් කරගෙන වෙනස් ලෙස සැලකීම - වයස ............................................ 31

**ප්‍රස්තාරය 46:** විවිධ ආයතනවල ජනවාර්ගිකත්වය පදනම් කරගෙන වෙනස් ලෙස සැලකීම - ප්‍රදේශ .......................................... 32

**ප්‍රස්තාරය 47:** විවිධ ආයතනවල ආගම අනුව වෙනස් ලෙස සැලකීම - ජාතික ................................................................. 32

**වගුව 04:** විවිධ ආයතනවල ආගම අනුව වෙනස් ලෙස සැලකීම - ආගමික ............................................................... 33

**ප්‍රස්තාරය 48:** විවිධ ආයතනවල ආගම අනුව වෙනස් ලෙස සැලකීම - ස්ත්‍රී පුරුෂභාවය ...................................................... 33

**ප්‍රස්තාරය 49:** විවිධ ආයතනවල ආගම අනුව වෙනස් ලෙස සැලකීම - වයස....34
**ප්‍රස්තාරය 50:** විවිධ ආයතනවල ආගම අනුව වෙනස් ලෙස සැලකීම - ප්‍රදේශ ....34

දේශපාලන අන්තර් සබඳතා .... 35

**ප්‍රස්තාරය 51:** ශ්‍රී ලංකාවේ සෑම ජනවාර්ගික කණ්ඩායමකටම සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි යැයි ඔබ සිතන්නේද? - ජාතික 35
**ප්‍රස්තාරය 52:** ශ්‍රී ලංකාවේ සෑම ජනවාර්ගික කණ්ඩායමකටම සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි යැයි ඔබ සිතන්නේද? - ජනවාර්ගික....35
**ප්‍රස්තාරය 53:** ශ්‍රී ලංකාවේ සෑම ජනවාර්ගික කණ්ඩායමකටම සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි යැයි ඔබ සිතන්නේද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ....36
**ප්‍රස්තාරය 54:** ශ්‍රී ලංකාවේ සෑම ආගමික කණ්ඩායමකටම සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි යැයි ඔබ සිතන්නේද? - ජාතික ....36
**වගුව 05:** ශ්‍රී ලංකාවේ සෑම ආගමික කණ්ඩායමකටම සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි යැයි ඔබ සිතන්නේද? - ආගමික 37
**ප්‍රස්තාරය 55:** ශ්‍රී ලංකාවේ සෑම ආගමික කණ්ඩායමකටම සාමකාමීව ජීවත් වීමට කොතරම්දුරට හැකි යැයි ඔබ සිතන්නේද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ....37

දේශපාලන නායකත්වය පිළිබඳ අදහස.... 38

**ප්‍රස්තාරය 56:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ජාතික....38
**ප්‍රස්තාරය 57:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද?- ජනවාර්ගික ....38
**ප්‍රස්තාරය 58:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ....39

ආගමික නායකත්වය පිළිබඳ අදහස .... 39

**ප්‍රස්තාරය 59:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ජාතික....39
**වගුව 06:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - ආගමික .... 40
**ප්‍රස්තාරය 60:** සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අපගේ ජාතික මට්ටමේ ආගමික නායකයින් කොතරම්දුරට අවංකවම කටයුතු කරනවාදැයි ඔබ සිතනවාද? - වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ .... 40

ආයතන කෙරෙහි විශ්වාසය.... 41

**ප්‍රස්තාරය 61:** ආයතන කෙරෙහි විශ්වාසය - ජාතික ....41
**ප්‍රස්තාරය 62:** ආයතන කෙරෙහි විශ්වාසය - ජනවාර්ගික....41
**ප්‍රස්තාරය 63:** ආයතන කෙරෙහි විශ්වාසය - ස්ත්‍රී පුරුෂභාවය .... 42
**ප්‍රස්තාරය 64:** ආයතන කෙරෙහි විශ්වාසය- වයස....43
**ප්‍රස්තාරය 65:** ආයතන කෙරෙහි විශ්වාසය - ප්‍රදේශ .... 44
**ප්‍රස්තාරය 66:** මාධ්‍ය කෙරෙහි විශ්වාසය - ජාතික....45
**ප්‍රස්තාරය 67:** මාධ්‍ය කෙරෙහි විශ්වාසය - ජනවාර්ගික.... 46
**ප්‍රස්තාරය 68:** මාධ්‍ය කෙරෙහි විශ්වාසය - වයස.... 47
**ප්‍රස්තාරය 69:** මාධ්‍ය කෙරෙහි විශ්වාසය - ස්ත්‍රී පුරුෂභාවය....48
**ප්‍රස්තාරය 70:** මාධ්‍ය කෙරෙහි විශ්වාසය - ප්‍රදේශ .... 49

සංහිඳියා ප්‍රතිපත්ති කෙරෙහි දක්වන ආකල්පය.... 50

**ප්‍රස්තාරය 71:** අනාගමික ව්‍යවස්ථාව කෙරෙහි ආකල්පය - ජාතික....50
**ප්‍රස්තාරය 72:** අනාගමික ව්‍යවස්ථාව කෙරෙහි ආකල්පය - ජනවාර්ගික ....50
**ප්‍රස්තාරය 73:** අනාගමික ව්‍යවස්ථාව කෙරෙහි ආකල්පය - ස්ත්‍රී පුරුෂභාවය....51
**ප්‍රස්තාරය 74:** අනාගමික ව්‍යවස්ථාව කෙරෙහි ආකල්පය - වයස ....51

**ප්‍රස්තාරය 75:** අනාගමික ව්‍යවස්ථාව කෙරෙහි ආකල්පය - ප්‍රදේශ ....... 52

සිහිපත් කිරීමේ ප්‍රතිපත්තිය කෙරෙහි දක්වන ආකල්පය ....... 52

**ප්‍රස්තාරය 76:** සිහිපත් කිරීමේ ප්‍රතිපත්තිය කෙරෙහි දක්වන ආකල්පය - ජාතික ....... 52
**ප්‍රස්තාරය 77:** සිහිපත් කිරීමේ ප්‍රතිපත්තිය කෙරෙහි දක්වන ආකල්පය - ජනවාර්ගික ....... 53
**ප්‍රස්තාරය 78:** සිහිපත් කිරීමේ ප්‍රතිපත්තිය කෙරෙහි දක්වන ආකල්පය - ස්ත්‍රී පුරුෂභාවය ....... 53
**ප්‍රස්තාරය 79:** සිහිපත් කිරීමේ ප්‍රතිපත්තිය කෙරෙහි දක්වන ආකල්පය - වයස ....... 54
**ප්‍රස්තාරය 80:** සිහිපත් කිරීමේ ප්‍රතිපත්තිය කෙරෙහි දක්වන ආකල්පය - ප්‍රදේශ ....... 54

සංහිඳියාව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම කෙරෙහි දක්වන ආකල්පය ....... 55

**ප්‍රස්තාරය 81:** සංහිඳියාව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම කෙරෙහි දක්වන ආකල්පය - ජාතික ....... 55
**ප්‍රස්තාරය 82:** සංහිඳියාව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම කෙරෙහි දක්වන ආකල්පය - ජනවාර්ගික ....... 55
**ප්‍රස්තාරය 83:** සංහිඳියාව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම කෙරෙහි දක්වන ආකල්පය - ස්ත්‍රී පුරුෂභාවය ....... 56
**ප්‍රස්තාරය 84:** සංහිඳියාව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම කෙරෙහි දක්වන ආකල්පය - වයස ....... 56
**ප්‍රස්තාරය 85:** සංහිඳියාව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම කෙරෙහි දක්වන ආකල්පය - ප්‍රදේශ ....... 56

ජාතික ගීය ගායනා කරන භාෂාව කෙරෙහි දක්වන ආකල්පය ....... 57

**ප්‍රස්තාරය 86:** ජාතික ගීය ගායනා කරන භාෂාව කෙරෙහි දක්වන ආකල්පය - ජාතික ....... 57
**ප්‍රස්තාරය 87:** ජාතික ගීය ගායනා කරන භාෂාව කෙරෙහි දක්වන ආකල්පය - ජනවාර්ගික ....... 57
**ප්‍රස්තාරය 88:** ජාතික ගීය ගායනා කරන භාෂාව කෙරෙහි දක්වන ආකල්පය - ස්ත්‍රී පුරුෂභාවය ....... 57
**ප්‍රස්තාරය 89:** ජාතික ගීය ගායනා කරන භාෂාව කෙරෙහි දක්වන ආකල්පය - වයස ....... 58
**ප්‍රස්තාරය 90:** ජාතික ගීය ගායනා කරන භාෂාව කෙරෙහි දක්වන ආකල්පය - ප්‍රදේශ ....... 58

සංහිඳියාව පිළිබඳ ආයතන ....... 58

**ප්‍රස්තාරය 91:** සත්‍යය, සමගිය සහ සංහිඳියාව සඳහා ස්වාධීන කොමිෂන් සභාව පිළිබඳ දැනුවත්භාවය - ජාතික ....... 58
**ප්‍රස්තාරය 92:** සත්‍යය, සමගිය සහ සංහිඳියාව සඳහා ස්වාධීන කොමිෂන් සභාව පිළිබඳ දැනුවත්භාවය - ජනවාර්ගික, වයස, ස්ත්‍රී පුරුෂභාවය සහ ප්‍රදේශ ....... 59
**ප්‍රස්තාරය 93:** සංහිඳියාව පිළිබඳ ආයතන පිළිබඳ දැනුවත්භාවය - ජාතික ....... 60
**ප්‍රස්තාරය 94:** සංහිඳියාව පිළිබඳ ආයතන පිළිබඳ දැනුවත්භාවය - ජනවාර්ගික ....... 60
**ප්‍රස්තාරය 95:** සංහිඳියාව පිළිබඳ ආයතන පිළිබඳ දැනුවත්භාවය - වයස ....... 61
**ප්‍රස්තාරය 96:** සංහිඳියාව පිළිබඳ ආයතන පිළිබඳ දැනුවත්භාවය - ස්ත්‍රී පුරුෂභාවය ....... 61
**ප්‍රස්තාරය 97:** සංහිඳියාව පිළිබඳ ආයතන පිළිබඳ දැනුවත්භාවය - ප්‍රදේශ ....... 62
**ප්‍රස්තාරය 98:** සංහිඳියාව සඳහා වන ආයතන පිළිබඳ තෘප්තිමත්භාවය - ජාතික ....... 62
**වගුව 07:** සංහිඳියාව සඳහා වන ආයතන පිළිබඳ තෘප්තිමත්භාවය - ජනවාර්ගික ....... 63
**වගුව 08:** සංහිඳියාව සඳහා වන ආයතන පිළිබඳ තෘප්තිමත්භාවය - ස්ත්‍රී පුරුෂභාවය ....... 63
**වගුව 09:** සංහිඳියාව සඳහා වන ආයතන පිළිබඳ තෘප්තිමත්භාවය - වයස ....... 64
**වගුව 10:** සංහිඳියාව සඳහා වන ආයතන පිළිබඳ තෘප්තිමත්භාවය - ප්‍රදේශ ....... ෑරරදරෟ ඊදදනප්රන බදළු ාෑසෙබැාග

## හැඳින්වීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ (CPA) සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසින් පවත්වන ලද සංහිඳියාව පිළිබඳ සමීක්ෂණයේ ප්‍රධාන සොයාගැනීම් මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කරයි. මෙම මත විමසුම සැලසුම් කරන ලද්දේ, ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය සහ සංහිඳියාව යන තේමාවන්ට අදාළ කරුණු සම්බන්ධයෙන් වර්තමාන මහජන මතය ග්‍රහණය කර ගැනීම සඳහාය.

2024 වසර වන විට, ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය අවසන් වී වසර 15ක කාලයක් ගත වී තිබේ. 2009 වසරේ යුද්ධය අවසන් වීමේ සිට බලයට පත් වු රජයන් ප්‍රකාශ කර සිටින්නේ, යුද්ධයෙන් පීඩාවට පත් වු ප්‍රජාවන් අතර සංහිඳියාව ඇති කිරීමට තමන් කටයුතු කරමින් සිටින බවයි. රාජ්‍ය ප්‍රයත්නයන්ට අමතරව, සිවිල් සමාජය ද රටට සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට සහ ස්ථිර සාමයක් ඇති කිරීමට බොහෝ මුල පිරීම්වල නිරත වේ. මෙම සන්දර්භය තුළ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ - සෝෂල් ඉන්ඩිකේටර් විසින් මෙම මත විමසුමට අවතීර්ණ වුයේ, ජනවාර්ගික ගැටුම හේතුවෙන් වසර 30කට වැඩි කාලයක් පීඩාවට පත් වු ප්‍රජාවන් අතර සංහිඳියාව ඇති කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා රට කෙතරම්දුරට ප්‍රගතියක් ලබා තිබේ ද යන්න විමසා බැලීමට ය. සංහිඳියාව තවමත් නිම නොකළ කාර්යක්ව පවතිද්දී, කල්පවත්නා වු සාමයක් සහ සංහිඳියාවක් සාක්ෂාත් කර ගැනීමේ වැදගත්කම විශ්වාස කරන ප්‍රතිපත්ති සම්පාදකයින් සහ විවිධ පාර්ශවකරුවන්ගේ අවංක උත්සාහයට ද මෙම සමීක්ෂණය මඟින් මඟ පාදයි.

මෙම සමීක්ෂණය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ (CPA) සමීක්ෂණ පර්යේෂණ අංශය වන සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසින් පවත්වන ලදී. එහි ආරම්භයේ සිටම (1999) ශ්‍රී ලංකාවේ සමාජ-දේශපාලනය වැනි පුළුල් පරාසයක ගැටළු කෙරෙහි අවධානය යොමු කර ඇත. ආචාර්ය ප්‍රදීප් පීරිස්, එම්. ක්‍රිෂ්ණමූර්ති, රංගනී රණසිංහ සහ ඉෂාරා ජයරත්න යන අයගෙන් මෙම සමීක්ෂණ කණ්ඩායම සමන්විත වේ. නිර්මාණ සහ වාර්තා සැකැස්ම සඳහා කවීන් පීරිස් සහාය විය. මෙම අධ්‍යයනයට දැක් වු සහාය සඳහා ආචාර්ය පාක්‍යසෝති සරවනමුත්තුට සහ භවානි ෆොන්සේකාට සෝෂල් ඉන්ඩිකේටර් (SI) විසින් ස්තුතිය පුද කරයි.

## ක්‍රමවේදය

මෙම සමීක්ෂණය සඳහා දිස්ත්‍රික්ක 25 න්ම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරට (සිංහල, දෙමළ, මලෛයහ දෙමළ සහ මුස්ලිම්) අයත් පුද්ගයන් 1372 ක් සහභාගී කර ගන්නා ලදී. බහු අදියර අහඹු ස්ථරීයකරණ නියැදි තාක්ෂණය භාවිතා කරමින් තෝරාගත් ප්‍රතිචාරකයින් අතර අර්ධ ව්‍යුහගත ප්‍රශ්නාවලියක් භාවිතයෙන් මෙම සමීක්ෂණය සිදු කරන ලදී. ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හතරට අයත් ක්ෂේත්‍ර සමීක්ෂකයන් 74 ක් (පුරුෂයන් සහ ස්ත්‍රීන්) සහභාගී කර ගනිමින් ක්ෂේත්‍ර කටයුතු 2024 පෙබරවාරි 19 වන දින සිට මාර්තු 13 වන දින දක්වා පවත්වන ලදී. දත්ත රැස් කිරීමේ ක්‍රියාවලිය අවසන් වු පසුව, ජනවාර්ගිකත්වය සහ දිස්ත්‍රික්කයේ සැබෑ ජනගහන අනුපාතය පිළිබිඹු කිරීම සඳහා දත්ත කට්ටලය බර තබා ඇත. සමාජීය විද්‍යාවන් සඳහා වන සංඛ්‍යාන පැකේජය (SPSS) භාවිතයෙන් දත්ත විශ්ලේෂණය කරන ලදී.

## විධායක සාරාංශය

### ආර්ථික කටයුතු සඳහා අවස්ථාවන්

- වසර 15කට පෙර පැවති තත්වය හා සසඳන විට ආර්ථික අවස්ථාවන් අඩු වී ඇති බව ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩකට ආසන්න පිරිසකට හැඟී යන බව පෙනෙයි. මෙම මතය සියලුම ප්‍රධාන ජනවාර්ගික ප්‍රජාවන් හරහා දක්නට ලැබෙන නමුත් අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම්වලට වඩා දෙමළ ප්‍රජාව අතර මෙම මතය දක්නට හැකිය. ඒ අනුව, දෙමළ ප්‍රජාවෙන් 56%කට ආසන්න ප්‍රමාණයක්, සිංහල ප්‍රජාවෙන් 49%ක් සහ මුස්ලිම් ප්‍රජාවෙන් 47%ක් පමණ ප්‍රකාශ කරන්නේ වසර 15කට පෙර තත්ත්වයට වඩා අඩු ආර්ථික අවස්ථා ඔවුන් දැන් අත්විඳින බවයි. එසේම, යෞවනයෙකු ලෙස යුද්ධයේ අත්දැකීම් ඇති (දැනට වයස අවුරුදු 31 සිට 45 දක්වා) සහ පරිණත පුද්ගලයකු ලෙස යුද්ධයේ අත්දැකීම් ඇති (දැනට වයස අවුරුදු 46 සහ ඊට වැඩි වයස් සීමාවන් තුළ) පුද්ගලයන් අතර ද අඩු ආර්ථික අවස්ථා පවතී යන මතය ඉහළ මට්ටමක පවතී. එසේම, ග්‍රාමීය ප්‍රජාව සහ ස්ත්‍රීන් හා සසඳන විට බොහෝ නාගරික ප්‍රජාව සහ පුරුෂයන් අතර මෙම අඩු ආර්ථික අවස්ථා පවතී යන මතය පවතින බව දක්නට හැකිය.

- අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට සාපේක්ෂව තමන්ගේම ජනවාර්ගික ප්‍රජාවට ආර්ථික අවස්ථා සඳහා ඇති ප්‍රවේශය පිළිබඳ ජනතාව සිතන්නේ කෙසේදැයි විමසූ විට, ශ්‍රී ලාංකිකයන් මිශ්‍ර මතයක් ඉදිරිපත් කරයි. එසේ වුවද, දෙමළ සහ මලෙයහ දෙමළ ප්‍රජාවන් පැහැදිලිවම සඳහන් කරන්නේ ආර්ථික අවස්ථා සඳහා ඔවුන්ට අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම්වලට සාපේක්ෂව අඩු ප්‍රවේශයක් ඇති බවයි. බහුතර සිංහල සහ මුස්ලිම් ප්‍රජාවන්ට හැඟෙන්නේ, තම ජනවාර්ගික ප්‍රජාවට අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම්වලට මෙන්ම ආර්ථික අවස්ථා සඳහා වැඩි ප්‍රවේශයක් හෝ සමාන ප්‍රවේශයක් ඇති බවයි.

- අනෙකුත් ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව තම ආගමික ප්‍රජාවට ආර්ථික අවස්ථාවන් සඳහා ඇති ප්‍රවේශය පිළිබඳ ජනතාව සිතන්නේ කෙසේදැයි විමසූ විට, ශ්‍රී ලාංකිකයන් මිශ්‍ර මතයක් ඉදිරිපත් කරයි. බෞද්ධ ප්‍රජාව තමන්ට අනෙකුත් ආගමික ප්‍රජාවන්ට වඩා ආර්ථික අවස්ථා සඳහා වැඩි ප්‍රවේශයක් හෝ සමාන ප්‍රවේශයක් ඇති බව පෙන්වා දෙන අතර, සුළුතර ආගමික ප්‍රජාව පෙන්වා දෙන්නේ අනෙකුත් ආගමික ප්‍රජාවන්ට වඩා තමන්ට ආර්ථික අවස්ථා සඳහා අඩු ප්‍රවේශයක් පවතින බවයි.

### අධ්‍යාපන සඳහා ඇති අවස්ථාවන්

- වසර 15කට පෙර හා සසඳන විට, අධ්‍යාපන අවස්ථා සඳහා ඇති ප්‍රවේශය පිළිබඳව විමසූ විට, ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (74.9%) ප්‍රකාශ කරන්නේ ඔවුන්ට ඒ සඳහා වැඩි ප්‍රවේශයක් ඇති බවයි. මෙම මතය සියලුම ජනවාර්ගික, ස්ත්‍රී පුරුෂ, ග්‍රාමීය සහ නාගරික මෙන්ම විවිධ වයස් කාණ්ඩවල සිටින පිරිස අතර ද දක්නට ලැබේ.

- අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට සාපේක්ෂව තමන්ගේම ජනවාර්ගික ප්‍රජාවට අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය තක්සේරුවට ලක් කරන ලෙස ජනතාවගෙන් විමසූ විට, මලෙයහ දෙමළ ප්‍රජාව හැරුණු විට, සිංහල, දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ගෙන් අති බහුතරයක් තම ප්‍රජාවන්ට අනෙකුත් ජනවාර්ගික ප්‍රජාවන්ට සාපේක්ෂව වැඩි ප්‍රවේශයක් හෝ සමාන ප්‍රවේශයක් ඇති බව ප්‍රකාශ කරයි.

- අනෙකුත් ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව තමන්ගේ ආගමික ප්‍රජාවට අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය තක්සේරුවට ලක් කරන ලෙස ජනතාවගෙන් විමසූ විට, අනෙකුත් ආගමික ප්‍රජාවන්ට සාපේක්ෂව තමන්ගේ ආගමික ප්‍රජාවන්ට වැඩි ප්‍රවේශයක් හෝ සමාන ප්‍රවේශයක් ඇති බව බෞද්ධ, හින්දු සහ ඉස්ලාම් අති බහුතරයක් සිතයි.

## ආරක්ෂිත බව/ අනාරක්ෂිත බව පිළිබඳ හැඟීම

- ශ්‍රී ලාංකිකයන්ගෙන් අතිමහත් බහුතරයක් ප්‍රකාශ කරන්නේ තම එදිනෙදා කටයුතු, ආගමික කටයුතු මෙන්ම ආර්ථික කටයුතුවල නිරත වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනෙන බවයි. මෙම අදහස සියලුම ජනවාර්ගික ප්‍රජාවන් (සිංහල, දෙමළ, මලෙයහ දෙමළ සහ මුස්ලිම්), වයස් කාණ්ඩ, ස්ත්‍රී - පුරුෂ සහ ප්‍රදේශ තුළින් නිරූපණය වේ.

- සියලුම ආගමික කණ්ඩායම්වලින් අතිමහත් බහුතරයක් ප්‍රකාශ කරන්නේ තම ප්‍රදේශයේ ආගමික කටයුතුවල නිරත වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනෙන බවයි. මෙම මතය සියලුම වයස් කාණ්ඩ, ස්ත්‍රී - පුරුෂ සහ ප්‍රදේශ අතර දක්නට ලැබේ.

- සියලුම ජනවාර්ගික ප්‍රජාවන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කරන්නේ ඔවුන්ට ආර්ථික කටයුතුවල නිරත වීම පිළිබඳ ආරක්ෂිත බවක් දැනෙන බවයි. මෙම මතය සියලුම වයස් කාණ්ඩ, ස්ත්‍රී - පුරුෂ සහ ප්‍රදේශයන් අතර දක්නට ලැබේ.

- වසර 15කට පෙර පැවති තත්ත්වය හා සැසඳීමේදී, තම පවුලේ සමස්ත ආරක්ෂාවේ වර්තමාන තත්වය තක්සේරුවට ලක් කරන ලෙස විමසූ විට, ශ්‍රී ලාංකිකයින්ගෙන් 40.7%ක් එය හොඳ අතට හැරී ඇති බව ප්‍රකාශ කළ අතර 33%ක් ප්‍රකාශ කළේ එහි වෙනසක් නොමැති බවයි. මේ වන විට තම පවුලේ සමස්ත ආරක්ෂාව හොඳ අතට හැරී ඇතැයි යන අදහස සුළුතර වාර්ගික ප්‍රජාවන්(දෙමළ- 53.9%, මලෙයහ දෙමළ - 62.5%, මුස්ලිම් - 50%) අතර ඉහළ මට්ටමක පවතියි. නමුත් මීට ප්‍රතිවිරුද්ධව, සිංහල ප්‍රජාව විසින් මිශ්‍ර මතයක් නිරූපණය කරන ලදී (හොඳ අතට හැරී ඇත- 36.4%, වෙනසක් නැත - 36.2%, නරක අතට හැරී ඇත - 26.6%).

- යුද්ධය පිළිබඳ අත්දැකීම් නොමැති (අවුරුදු 18 - 30) පිරිස මෙන්ම නාගරික ප්‍රජාවගෙන් බහුතරයක් ප්‍රකාශ කරන්නේ වසර 15 කට පෙර තත්ත්වය හා සසඳනවිට තම පවුලේ ආරක්ෂාව වැඩි දියුණු වී ඇති බවයි.

## සමාජීය විශ්වාසය

- හදිසි අවස්ථාවකදී සහාය ලබා ගැනීමට යමෙකු කොතරම් දුරට විශ්වාස කරන්නේ දැයි විමසූ විට, බහුතරයක් තම සමීපතම අසල්වැසියාගෙන් හෝ අසල්වැසි තම ඥාතීන්ගෙන් උපකාර ලබා ගැනීමට වැඩි කැමැත්තක් දක්වන බව ප්‍රකාශ කරයි. මෙම මතය සියලුම ජනවාර්ගික කණ්ඩායම් අතර දක්නට ලැබෙන නමුත්, සෑම ජනවාර්ගික ප්‍රජාවක්ම තමන්ගේම ජනවාර්ගික ප්‍රජාවගෙන් උපකාර ලබාගැනීමට වැඩි කැමැත්තක් දක්වනු ලැබේ.

## සමාජ අන්තර් සබඳතා

- ශ්‍රී ලාංකිකයන් වෙනත් ජනවර්ගයක් සමග කොපමණ වාරයක් සබඳතා (අන්තර් සබඳතා) පවත්වන්නේ දැයි විමසූ විට මිශ්‍ර මතයක් ප්‍රකාශ කරයි. කෙසේ වෙතත්, වෙනත් ජනවර්ගයක් සමඟ අන්තර් සබඳතා ඇති අය අතර මලෙයහ දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන් සැලකිය යුතු ලෙස ඉහළ අගයක් ගනී. එසේම, වෙනත් ජනවර්ගයක් සමඟ නිතර අන්තර් සබඳතා පවත්වන අය අතර පුරුෂයින් සහ නාගරික ප්‍රජාව සාපේක්ෂ වශයෙන් ඉහළ ය.

- ශ්‍රී ලාංකිකයන්ගෙන් ආසන්න වශයෙන් 80% ක් පමණ "මගේ ගමේ මිනිස්සු මගේ වාර්ගිකත්වය නොසලකා බොහෝ විට මට හොඳ විදියට සලකනවා" සහ "මම රජයේ ආයතනයන්ගෙන් සේවයක් ලබා ගැනීමට යාමේදී, මගේ වාර්ගිකත්වය නොසලකා ඔවුන් බොහෝ විට මට හොඳ විදියට සලකනවා" යන ප්‍රකාශ සමග එකඟ වේ. එසේම, "පොලිසිය සමඟ ආයතනික මට්ටමේ කටයුත්තකට සම්බන්ධ වීමේදී, මගේ වාර්ගිකත්වය නොසලකා ඔවුන් බොහෝ විට මට හොඳ විදියට සලකනවා" යන ප්‍රකාශය සමග 70% ක් පමණ එකඟ වන බව ප්‍රකාශ කරයි.

- "මගේ ගමේ මිනිස්සු මගේ වාර්ගිකත්වය නොසළකා බොහෝ විට මට හොඳ විදියට සලකනවා" යන ප්‍රකාශය සමඟ එකඟ වන අය අතර සිංහල (88.4%), මලෙයහ දෙමළ (87.7%) සහ මුස්ලිම් (80.5%) ප්‍රජාවන් ඉහළ මට්ටමක සිටින අතර මෙම අදහසම දරන දෙමළ ප්‍රජාව 51.3% ක් පමණක් සිටියි.

- "රජයේ ආයතනයන්ගෙන් සේවයක් ලබා ගැනීමට යාමේදී, මගේ වාර්ගිකත්වය නොසලකා ඔවුන් බොහෝ විට මට හොඳ විදියට සලකනවා" යන ප්‍රකාශය සමඟ එකඟ වන අය අතර සිංහල (80.1%), මලෙයහ දෙමළ (85.7%) සහ මුස්ලිම් (80.5%) ප්‍රජාවන් සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගනී. නමුත් එම මතය දරන්නේ දෙමළ ප්‍රජාව 71.2% පමණි. මෙම ප්‍රකාශය සමඟ එකඟ නොවන අය අතර ග්‍රාමීය ප්‍රජාවට (10.4%) වඩා නාගරික ප්‍රජාව (22.9%) සාපේක්ෂ වශයෙන් ඉහළ ය.

- "පොලිසිය සමඟ ආයතනික මට්ටමේ කටයුත්තකට සම්බන්ධ වීමේදී, මගේ වාර්ගිකත්වය නොසලකා ඔවුන් බොහෝ විට මට හොඳ විදියට සලකනවා" යන ප්‍රකාශය සමඟ එකඟ වන අය අතර සිංහල (69.6%), මලෙයහ දෙමළ (66.7%) සහ මුස්ලිම් (71.1%) ප්‍රජාව සාපේක්ෂව ඉහළ අගයක් ගනී. නමුත් එම මතය දරන්නේ දෙමළ ප්‍රජාව 57.8% පමණි. මෙම මතය දරන අවුරුදු 18 සිට 45 දක්වා වයස් කාණ්ඩය සහ ග්‍රාමීය ප්‍රජාව සුළු වශයෙන් ඉහළ ය.

## විවිධ ජනවාර්ගික කණ්ඩායම් කෙරෙහි දක්වන ආකල්පය

- සමීක්ෂණයට සහභාගීවූවන්ට උපකල්පිත අවස්ථා තුනක් ලබා දී ඇත; එනම්, "අසල්වැසියන්ගෙන් අධිකට වඩා වෙනස් ජනවාර්ගික කණ්ඩායමක් සිටින අසල්වැසි ප්‍රදේශයක ජීවත් වීම", "විවිධ ජනවාර්ගික ප්‍රජාවන්ට අයත් පුද්ගලයන් සමඟ වැඩ කිරීම" සහ "සමීප පවුලේ සාමාජිකයෙකු වෙනත් ජනවර්ගයකට අයත් කෙනෙකු සමඟ විවාහ වීම" යන අවස්ථාවන්ය. ප්‍රතිචාරකයින්ගෙන් මෙම එක් එක් අවස්ථා සඳහා ඔවුන්ගේ එකඟතාවයේ මට්ටම ප්‍රකාශ කරන ලෙස ඉල්ලා සිටින ලදී. ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් (80%ක් පමණ) "විවිධ ජනවාර්ගික ප්‍රජාවන්ට අයත් පුද්ගලයන් සමඟ වැඩ කිරීම" යන අවස්ථාවට එකඟ වේ. මෙහිදී, "අසල්වැසියන්ගෙන් අධිකට වඩා වෙනස් ජනවාර්ගික කණ්ඩායමක් සිටින අසල්වැසි ප්‍රදේශයක ජීවත් වීම" හෝ "පවුලේ සමීපතම සාමාජිකයෙකු වෙනත් ජනවර්ගයකට අයත් කෙනෙකු සමඟ විවාහ වීම" යන අවස්ථාවන්ට එකඟ වන්නේ ශ්‍රී ලාංකිකයන්ගෙන් අධික් පමණි.

- "අසල්වැසියන්ගෙන් අධිකට වඩා වෙනස් ජනවාර්ගික කණ්ඩායමක් සිටින අසල්වැසි ප්‍රදේශයක ජීවත් වීම" යන අවස්ථාවට මලෙයහ දෙමළ (59.6%) සහ මුස්ලිම් (67.7%) ප්‍රජාවන්ගෙන් අධිකට වඩා එකඟ වේ. එසේම, සිංහල ප්‍රජාවගෙන් අධික පමණ ප්‍රතිශතයක් ද එම අදහසම ප්‍රකාශ කරයි. කෙසේ වෙතත්, දෙමළ ප්‍රජාව (39.2%) අතර එම මතය සඳහා එකඟත්වය සාපේක්ෂ වශයෙන් අඩුය.

- අවුරුදු 18 සිට 45 දක්වා වයස් කාණ්ඩය සහ නාගරික ප්‍රජාව අතර ද එම එඟතාවය ඉහළ මට්ටමක පවතී.

- සිංහල, මලෙයහ දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවන්ගෙන් 70% කට වැඩි ප්‍රමාණයක් විවිධ ජනවාර්ගික ප්‍රජාවන්ට අයත් පුද්ගලයන් සමඟ වැඩ කිරීමට එකඟත්වය පළ කරයි. කෙසේ වෙතත්, මෙම එකඟත්වය දෙමළ ප්‍රජාව අතර (59.5%) සාපේක්ෂ වශයෙන් අඩුය. පුරුෂයන් සහ ග්‍රාමීය ප්‍රජාව අතර මෙම මතය සඳහා එකඟත්වය සුළු වශයෙන් ඉහළ මට්ටමක පවතී.

- සමීප පවුලේ සාමාජිකයෙකු වෙනත් ජනවර්ගයක කෙනෙකු සමඟ විවාහ වීම යන අදහසට සිංහල (49.6%) සහ මලෙයහ දෙමළ (56.1%) ප්‍රජාවන්ගෙන් බහුතරයක් එකඟ වෙයි. මෙම මතය සඳහා එකඟත්වය දෙමළ (34.4%) සහ මුස්ලිම් (35.2%) ප්‍රජාවන් අතර සාපේක්ෂ වශයෙන් අඩුය. තරුණ ප්‍රජාව හා පුරුෂයන් අතර එම මතය සඳහා එකඟතාව සාපේක්ෂ වශයෙන් ඉහළ අගයක් ගනී.

- ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කරන්නේ පසුගිය වසර දෙක තුළ පාසල, රැකියා ස්ථානය, සුභසාධන දීමනා ලබාදෙන අවස්ථාව, පොලිසිය මෙන්ම අසල්වාසීන් සමඟ ආරවුලක් ඇති වී යුක්තිය (සාධාරණත්වයක්) සෙවීමේදී ද ඔවුන්ගේ ජනවාර්ගික පසුබිම හේතුවෙන් ඔවුන්ට අසාධාරණයක් සිදු නොවූ බවයි. 9.1% ක් ප්‍රකාශ කර සිටින්නේ සුබසාධන දීමනා ලබාදෙන කාර්යයකට සහායක් ලබාගැනීමේදී තමන්ට අසාධාරණයක් සිදුව ඇති බවයි. එසේම, 4.2% ක් ප්‍රකාශ කරන්නේ පොලිසිය සමඟ කටයුතු කිරීමේදී අසාධාරණ ලෙස සැලකූ බවයි.

- ශ්‍රී ලාංකිකයන්ගෙන් බහුතරයක් ප්‍රකාශ කරන්නේ පසුගිය වසර දෙක තුළ පාසල, රැකියා ස්ථානය, සුභසාධන දීමනා ලබාදෙන අවස්ථාව, පොලිසිය මෙන්ම අසල්වාසීන් සමඟ ආරවුලක් ඇති වී යුක්තිය (සාධාරණත්වයක්) සෙවීමේදී

ද ඔවුන්ගේ ආගමික පසුබිම හේතුවෙන් ඔවුන්ට අසාධාරණයක් සිදු නොවූ බවයි. 7.2% ක් ප්‍රකාශ කර සිටින්නේ සුබසාධන දීමනා ලබාදෙන කාර්යයකට සහායක් ලබාගැනීමේදී තමන්ට අසාධාරණයක් සිදුව ඇති බවයි. එසේම, 3.3% ක් ප්‍රකාශ කරන්නේ පොලිසිය සමඟ කටයුතු කිරීමේදී අසාධාරණ ලෙස සැලකූ බවයි.

## දේශපාලන අන්තර් සබඳතා

- ශ්‍රී ලාංකිකයන්ගෙන් අති බහුතරයක් සිතන්නේ, ශ්‍රී ලංකාව තුළ සියලුම ජනවාර්ගික කණ්ඩායම්වලට සාමකාමීව ජීවත් විය හැකි බව (89.7%) යි. එසේම ශ්‍රී ලාංකිකයන්ගෙන් අති බහුතරයක් ශ්‍රී ලංකාව තුළ සියලුම ආගමික කණ්ඩායම්වලට (89.6%) සාමකාමීව ජීවත් විය හැකි බව සිතයි. මෙම මතය සියලුම ජනවාර්ගික කණ්ඩායම් අතර දක්නට ලැබේ.

- සියලුම ජනවාර්ගික කණ්ඩායම්වලින් අතිමහත් බහුතරයක් ශ්‍රී ලංකාවේ සියලු ජනවර්ගවලට සාමකාමීව බොහෝ දුරට හෝ තරමක් දුරකට ජීවත් විය හැකි බව සිතයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ සියලු ජනවාර්ගික කණ්ඩායම්වලට කිසිසේත්ම සාමකාමීව ජීවත් විය නොහැකි බව හැඟී ගිය දෙමළ ප්‍රජාවගෙන් 14% ක් සහ මලෙයහ දෙමළ ප්‍රජාවෙන් 12% ක් සිටින බව සැලකිල්ලට ගත යුතු කරුණකි. යුද්ධය අවසන් වී වසර 15කට පසු, යෞවනයකු ලෙස යුද්ධයේ අත්දැකීම් ඇති ශ්‍රී ලාංකිකයන්, ඔවුන්ගේ වැඩිහිටි සහ තරුණ කණ්ඩායම් සමඟ සසඳන විට, ශ්‍රී ලංකාවේ සියලුම ජනවර්ගවලට සාමකාමීව ජීවත් විය හැකි බව බොහෝ දුරට සිතයි.

- සියලුම ආගමික කණ්ඩායම්වලින් අතිමහත් බහුතරයක් ප්‍රකාශ කරන්නේ, ශ්‍රී ලංකාව තුළ සාමකාමීව බොහෝ දුරට හෝ තරමක් දුරට සියලුම ආගමික කණ්ඩායම්වලට ජීවත් විය හැකි බව හැඟෙන බවයි.

- යුද්ධය අවසන් වී වසර 15කට පසු, යෞවනයකු ලෙස යුද්ධයේ අත්දැකීම් ඇති ශ්‍රී ලාංකිකයන්, ඔවුන්ගේ වැඩිහිටි සහ තරුණ කණ්ඩායම් සමඟ සසඳන විට, සියලු ආගමික කණ්ඩායම්වලට ශ්‍රී ලංකාව තුළ සාමකාමීව ජීවත් විය හැකි බව බොහෝ දුරට සිතයි.

## දේශපාලන නායකත්වය පිළිබඳ අදහස

- මෙම සමීක්ෂණය මඟින් ශ්‍රී ලංකාව තුළ සාමය ඇති කිරීම සඳහා දේශපාලන නායකත්වයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ මහජන මතය තක්සේරු කිරීමට උත්සාහ ගන්නා ලදී. ශ්‍රී ලාංකිකයන්ගෙන් 70% ක් පමණ සිතන්නේ ඔවුන්ගේ ජාතික මට්ටමේ දේශපාලන නායකයන් සියලු ශ්‍රී ලාංකිකයන්ට සාමකාමී ජීවිතයක් ළඟාකර දීමට අවංකව කැප නොවන බවයි. විශේෂයෙන් දක්නට ලැබෙන්නේ, සෑම වයස් කාණ්ඩ, විවිධ ප්‍රදේශ සහ ස්ත්‍රී පුරුෂ කණ්ඩායම් අතර සමානව වශයෙන් මෙම මතය පවතින බවයි.

## ආගමික නායකත්වය පිළිබඳ අදහස

